# කොටි කෙනිත්තිලි යට රහස් සැළසුමක්

## හමුදාව නොමඟ යවා කොටි ආයුධ බා ගත්තා ද..?

**වී.ආර්. පෙරේරා**

**එල්.ටී.ටී.ඊ.** සංවිධානය රජයේ හමුදාවත් ඉලක්ක කරගෙන ඉකුත් මාසයේ සිට ඇරඹූ ප්‍රහාර මාලාව නිසා ශ්‍රී ලංකාව තුළ යුදමය වාතාවරණයක් හට ගන්නා තත්ත්වයක් ඇති විය.

අසූ ගණන්වල මෙන් තැනින් තැන බෝම්බ පුපුරා යන්නටත්, ආරක්ෂක අංශවලට එරෙහිව ප්‍රහාර එල්ල වන්නටත් වූයෙන් මෙවැනි උණුසුමක් පැතිරයන්නට හේතුවිය.

සටන් විරාම ගිවිසුමක් අත්සන් කර කොටින්ට සන්නද්ධ, මූල්‍ය හා පිරිස් බලය වැඩිකර ගැනීමට ඉඩදී රජයේ හමුදාවත් මානසිකව හා යුදමය අතින් පහළ දැමීමට මෙතෙක් සිටි පාලකයන් ගෙන ගිය වැඩපිළිවෙළට තිතක් තැබීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා යෙදූ වැඩපිළිවෙලද කොටින්ගේ මෙම ප්‍රහාරවලට හේතුපාදක විය.

දක්ෂ යුද සෙන්පතියකු වූ ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා මහතා නව යුද හමුදාපතිවරයා වශයෙන් පත් කරනු ලැබුවේද යුද හමුදාව මානසික හා යුදමය අතින් ඉහළට ගැනීමේ අභියෝගයන්ද ලබා දෙමිනි.

මෙම සියළු කාරණා සැලකිල්ලට ගත් කොටි සංවිධානය යාපනය යළි අත්පත් කර ගැනීමේ අරමුණින් උපක්‍රමශිලී ප්‍රහාර මාලාවක් ඇරඹිය.

අත්බෝම්බ හා සුළු වෙඩි ප්‍රහාර අරඹමින් පටන් ගත් මෙම ප්‍රහාරමාලාව ක්ලේමෝ, ආර්.පී.ජී. හා තර්මෝබැරික් ප්‍රහාර දක්වා ව්‍යාප්ත විණි.

දෙසැම්බර් 04 වැනිදා සිට 27 වැනිදා දක්වා එල්ල වූ කොටි බෝම්බ ප්‍රහාර වලින් පමණක් රජයේ ආරක්ෂක අංශ සාමාජිකයන් පනස්දෙනෙකු මරණයට පත්විය. ඒ අතරට යුද හමුදාවේ ලුතිනන්වරයකු ඇතුළු 32 ක්, නාවිකා හමුදාවේ 14 ක් හා පොලිසියේ 04 ක්ද විය.

මෙම ප්‍රහාර වලින් යුද හමුදා සෙබළුන් තිහක් ඇතුළුව ආරක්ෂක අංශ සාමාජිකයන් හැටදෙනෙකු තුවාල ලදහ. මේ ගෞරවාන්විත සාමයක් යැයි කියා කොටි කළ ක්‍රියාකාරකම් වලින් කිහිපයක් පමණි.

කොටින්ට ත්‍රස්ත ක්‍රියාකාරකම් නවත්වන්නැයි ශ්‍රී ලංකාවට ආධාර දෙන සම සභාපතිවරුන්ගේ රටවල තානාපතිවරුන් දිගින් දිගටම කළ බලපෑම් පවා නොතකමින් කොටි සංවිධානය මෙම ප්‍රහාර මාලාවන් දියත් කළහ.

යාපනය, කොන්ඩාවිල් හිදි ක්ලේමෝ ප්‍රහාරයකින් සෙබළුන් හත්දෙනකු සමග ට්‍රැක්ටරයක් පුපුරුවා හමුදා සෙබළුන් හත්දෙනකු මරා දැමූහ. ඒ දෙසැම්බර් 04 වැනිදා ය. ඊට දින දෙකකට පසු (06) යාපනය, ඉරුවාලේ හිදී තවත් ක්ලේමෝ ප්‍රහාරයක් එල්ල කර ලුතිනන්වරයකු ඇතුළු හමුදාවේ අටදෙනකු මරා දැමූහ.

එතැනින් නොනැවතුණු කොටි ත්‍රස්තවාදීන් ඉකුත් 23 වැනිදා මන්නාරම, නඩුකුඩා හිදී නාවික සෙබළුන් ගමන්ගත් බස් රථයකට ක්ලේමෝ හා තර්මෝබැරික් ප්‍රහාරයක් එල්ල කර නාවික සෙබළුන් 13 දෙනෙකු අමු අමුවේ



ආරක්ෂාව

මරා දැමූහ. තර්මෝබැරික් ප්‍රහාරයෙන් ගිණිගත් බස් රථයේ සිටි නාවික සෙබළු බස් රථය තුලම ගිනිගෙන දැවුනේය.

ඊට පෙරදිනද (22) මන්නාරම, පල්ලිමුණේ දී නාවික මුර සංචාරක බෝට්ටු දෙකකට පහර දී නාවික සෙබළුන් තිදෙනෙකු පැහැර ගෙන ගියහ. ධීවරයන් මෙන් බෝට්ටුවලින් පැමිණි කොටි ත්‍රස්තවාදීහු මෙම ප්‍රහාරය එල්ල කලහ. යාපනය පුලෝලි හිදි 27 වනදා එල්ල වූ කොටි ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකිනුත් හමුදා සෙබළුන් 12 ක් මිය ගියහ.

යාපනයේ ප්‍රහාර අතරතුරේ කොටි මන්නාරමටත් ප්‍රහාර එල්ල කලේ කොටින්ට අවි රැගෙන විත් ජාත්‍යන්තර සීමාවේ නවතා තිබූ ආයුධ නැවකින් අවි ගොඩබා ගැනිමේ අරමුණෙන් බව බුද්ධි අංශ සැක පහල කර ඇත.

පල්ලිමුණේ ප්‍රහාරයට දින කිහිපයකට පටන් ජාත්‍යන්තර සීමාවේ කොටි නැවක් සැරිසරන බවටද බුද්ධි අංශ වෙත තොරතුරු ලැබී තිබිණි.

කොටි මේ වනතෙක් අවි බා ගත් ආකාරයට මෙවරත් නාවික හමුදාවේ අවධානය එක් තැනකට යොමුකර අවි බාගත් බව සැකයට භාජනය වී ඇත. මීට පෙරදිත් මුහුදේ යම් තැනක හමුදාව සමග ගැටුමක් ඇතිකර ගෙන තවත් තැනකින් අවි බා ගැනීමට කොටි සංවිධානය කටයුතු කළහ.

මේ සියලු කාරණා හරහා එළිවෙන්නේ සටන් විරාම කාලය තුළදී කොටි තවදුරටත් සන්නද්ධ වන බවය.

එමෙන්ම එක්දහස් නවසිය අසූගණන් වලදී මෙන් යාපනයේදී හමුදාවට තැනින් තැන ප්‍රහාර එල්ල කර හමුදා කඳවුරු වලට සීමා කල ආකාරයට යළිත් හමුදාව කඳවුරු තුලට සිර කිරීමට ගෙනයන සැලසුමක් කොටි විසින් සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතින බව බුද්ධි අංශ අනතුරු හඟවා ඇත.

යාපනයේදී දිගින් දිගටම ප්‍රහාර එල්ල කරන්නේත් මෙම සැලසුමට අනුවය. කොටි සංවිධානය අසූ ගණන්වලදී හමුදා කඳවුරු තුළට සිමාකර, කඳවුරු වලට පහර දී කඳවුරු අල්ලා ගැනීමටත්, අනතුරුව යාපනය අල්ලා ගැනිමටත් සූක්ෂම සැලසුමක් දියත් කළේය.

රිවිරැස හමුදා මෙහෙයුම මගින් යාපනය රජයේ හමුදා අතට යළි පත්වීමත් සමග යාපනය යළි අල්ලා ගැනීමට කොටි නායක ප්‍රභාකරන් හට දැඩි අවශ්‍යතාවයක් විය. කොටින්ගේ විශ්ලේෂණ අංශ භාර ප්‍රධානි ශෂිකුමාර් මාස්ටර් ලවා යාපනය යළි මුදා ගැනීමට සැලසුම් සකස් කළේද මේ නිසා බව බුද්ධි අංශ පෙන්වා දෙයි.

මෙම සැලසුම්වලට අනුව යාපනයට පිටතින් ප්‍රහාර එල්ල කර එය අල්ලා ගැනීමට කොටි කිහිපවතාවක්ම ගත් උත්සාහය අසාර්ථක වූ තැන යාපනය හමුදා පාලන ප්‍රදේශයේ අභ්‍යන්තරයටම ගොස් ප්‍රහාර දියත් කිරීමේ සැලසුම මේ වනවිට සූක්ෂම ලෙස ක්‍රියාත්මක කරමින් පවතී.

සටන් විරාමයට පෙර උතුරේ කිසිදු බලයක් නොතිබුණු කොටි ත්‍රස්තවාදීන් යාපනය රජයේ පාලන ප්‍රදේශය තුල සෑම් මිසයිල 02 ක්, ආර්.පී.ජී. , මෝටාර් හා ක්ලේමෝ වැනි බර අවිද මේ වනවිට රැගෙන විත් ඇතැයි බුද්ධි අංශ වාර්තා වල සඳහන්ය.

පසුගිය කාලසීමාවන් තුළ සෝදිසි මෙහෙයුම් හා අනෙකුත් මෙහෙයුම් නතර කිරීම නිසා කොටින්ට පහසුවෙන් යාපනය අර්ධද්වීපයට පිවිස එහි ජනතාවට බලපෑම් කිරීමට හැකි වූ බව හමුදාපති සරත් ෆොන්සේකා මහතා ද පෙන්වා දෙන්නේය.

සටන් විරාමය අත්සන් තැබීමත් සමග යළි පදිංචි වන පවුල් මුවාවෙන් කොටි මහාවිර පවුල් (මියගිය කොටින්ගේ පවුල්) පහලොස් දහසක් පමණ යාපනය තුළ පදිංචි කරවීමට කොටි පියවර ගත්හ. එම පිරිස් යාපනය අධි ආරක්ෂිත කලාප තුලද පදිංචි කරවීමට කොටි නායකත්වය පවා උත්සාහ කලද එවකට යාපනය ආඥාපතිව සිටි නව හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා මහතාගෙන් ඊට ඉඩක් ලැබුනේ නැත.

අධි ආරක්ෂිත කලාප වලට පිටතින් මෙම පවුල් පදිංචි කෙරුණ අතර ඔවුන්ව වන්නියට කැඳවාලීමට කොටි නායකත්වය ඉකුත් සතිවල පියවර ගත්හ. මේ අනුව පසුගිය සති කිහිපය තුළ දෙමළ මහාවිර පවුල් 700 ක් පමණ මුහුමාලේ බාධකය හරහා වන්නිය බලා ගියහ.

කොටි ඒ වනවිටත් මහාවිර පවුල්වලින් තෝරාගත් දෙදහසකට පමණ වන්නියේ පලෙයිවලදී දින හා සති වශයෙන් යුධ පුහුණුව ලබාදී තිබුනේද මෙවැනි අවස්ථාවක ප්‍රයෝජන ගැනීමටය.

මේ වනවිට යාපනයේ බංකර් වලට පහරදීම් කර ඇත්තේද මක්කල් පඩෙයි (මහජන හමුදාව) ලෙසින් හඳුනා ගත් මෙම මහාවිර පවුල්වල සාමාජිකයන් බව බුද්ධි අංශ හෙලිකරගෙන ඇත.

කොටි සටන් විරාමය අත්සන් කල විගස ත්‍රිකුණාමල වරාය වටා කඳවුරු ඉදිකර ඇත්තේ ද යාපනය උපක්‍රමිකව අල්ලා ගැනීමේ අරමුණ යටතේය.

ත්‍රිකුණාමල වරායට පහර දී යාපනයට මුහුදෙන් යැවෙන සියලු සැපයුම් නවත්වා යාපනයේ රඳවා සිටින සෙබළුන් අකර්මන්‍ය කිරීමේ අරමුණ ඇතිව ඒ වටා කොටි කඳවුරු ඉදිකර ගත්හ. වරාය වටා කාලතුවක්කු හා මෝටාර් ස්ථාන ගත කලහ.

මේ අනුව යළිත් යුද්ධයක් ඇති වී ත්‍රිකුණාමල වරාය ප්‍රහාරයකට ලක්වී සැපයුම් ඇනහිටියොත් උතුරේ සිටින සෙබළුන් 45,000 කගේ ජීවිතද අවදානමකට ලක් කිරීමට කොටි සැලසුම බව සැබවින්ම පැහැදිලිය.

යාපනය යළි අල්ලා ගැනීමට කොටි සැලසුම් සකසද්දී කොටින්ගේ කොළඹ මෙහෙයුම් භාරව සිටි ප්‍රධානියා වන 'ඇට්ලස් බාලා' මරුමුවට පත්වීම කොටින්ට දරාගත නොහැකි විය. මෙම 04 වැනිදා වැල්ලවත්තේ දී ඇට්ලස් බාලා ඝාතනයට ලක්විණි.

කොළඹ රැදි සිටින ද්‍රවිඩ ව්‍යාපාරිකයන්ගෙන් කප්පම් එකතු කර කොටින්ගේ ගිණුම්වලට දැමීමේ කාර්යය ඇට්ලස් බාලා විසින් කාලයක් තිස්සේම කරගෙන ගොස් ඇති බවත්, කොළඹට පැමිණෙන කොටින්ට නවාතැන් ලබාදීම, ප්‍රවාහනය ඇතුළු කාර්යයන් භාරව සිටින්නේත් මොහු බව බුද්ධි අංශ හෙලිකරගෙන තිබිණි.

කොළඹ - යාපනය අතර පවත්වාගෙන යන ඇට්ලස් ට්‍රැවල්ස් නමැති සුඛෝපභෝගී බස් සේවාවන්, ගුවන් ටිකට්පත් නිකුත් කරන ආයතන, ගුවන් හා නාවික භාණ්ඩ නිෂ්කාෂණ කරන ආයතන, දුරකතන හල් පවා පවත්වාගෙන ගිය කෝටිපති ව්‍යාපාරිකයකු වන ඇට්ලස් බාලා (නඩරාජා බාලේන්ද්‍රන්) කොටි මූල්‍ය අංශ ප්‍රධානි රංජිත් අප්පාගේ මස්සිනා කෙනකුද වේ.

සුනාමි ව්‍යසනය අවස්ථාවේ උතුරේ වැසියන්ට විදේශ වලින් සුනාමි ආධාර ලෙසින් ලද කෝටි 10 ක පමණ විදුලි උපකරණ හා පරිගණක උපාංග පැන්නීමේ සිද්ධියකටද රංජිත් අප්පා හා ඇට්ලස් බාලා සම්බන්ධ බවද මේ වනවිට හෙලිවෙමින් පවතී.

කොටින්ගේ කොළඹ සිටි ප්‍රධාන චරිතයක් අහිමි වී යද්දි මන්නාරම, මුල්ලිකුලම් මුදා නොගත් ප්‍රදේශයේදී කොටි මේජර් තනතුරක් උසුලන වචිනයාව බටහිර භාර නායක ජේයානත්තන් ක්ලේමෝ ප්‍රහාරයකින් ඝාතනයට ලක්වීමෙන් ද කොටි සංවිධානය සලිත වී